# අලිගැට පේර වගාව

"මෙම පළතුරු වර්ගය ලංකාවේ තෙත් කලාපයේ වගා කිරීමට යෝග්‍යය. මැද රට තෙත් කලාපයේ මෙම පලතුරු වර්ගය ඉතා හොඳින් වැවේ. පහත රට තෙත් කලාපයේ ද දත සුළං රහිත ප්‍රදේශවල මෙම පලතුරු වර්ගය වගා කල හැක. සාර්ථක වගාවකට අවශ්‍ය වන්නේ හොඳින් විහිදී ඇති අගල් 30—43 (මිලි මිටර් 7500—10000) වර්ෂා පතනයක් වුවත්, සමහර ප්‍රභේද නිවර්තන තත්වයෙන් යටතේ අගල් 100 වැඩි (මිලි මීටර් 25,000) වර්ෂා පතනයක් සහිත ප්‍රදේශ වලද වගා කෙරේ. හොඳින් ජලය බැස යන ලෝම පසක් අලි ගැට පේර වගාවක් සඳහා සුදුසු වේ. පසේ දූර්වල ජලවහන තත්වය වගාව කෙරෙහි අහිත කර ලෙස බලපායි. වියළි කලාපයේ වගා කරන්නේ නම් ජල සම්පාදන පහසුකම් තිබිය යුතුය."

කුන්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ
කථිකාචාර්ය

**පී. කේ. කේ. ආර්. පෙරේරා**
**විසිනි.**

අලිගැට පේර ලොරේසියේ කුලයට අයත් වන අතර **පර්සියා ඇමරිකානා** යන උද්භිද විද්‍යාත්මක නමින් හඳුන් වනු ලැබේ. අලිගැට පේර හෙවත් අලි පේර ලංකාවේ ඇති පලතුරු අතරින් ඉතා පෝෂ්‍යදායී පලතුරු වර්ගයකි. මෙම පලතුරෙහි අධික මේද ප්‍රමාණයක් අඩංගු වී ඇති නමුත් ශරීරයට අහිතකර මේද වලින් තොර බව වාර්තාවේ. මෙම පලතුරේ අඩු කාබොහයිඩ්රේට් ප්‍රමාණ යක් හා වැඩි කැලරි ප්‍රමාණයක් ඇති නිසා දියවැඩියාවෙන් පෙලෙන්නන් හට දිය හැකි අගනා ආහාරයකි. මෙයට අමතරව ශරීරයට අවශ්‍ය විටමින්, ඛනිජ ලවන හා ප්‍රෝටීන් අලිගැට පේර වල අඩංගු වේ.

**පරිසර අවශ්‍යතා**

මෙම පලතුරු වර්ගය ලංකාවේ තෙත් කලාපයේ වගා කිරීමට යෝග්‍ය පලතුරු වර්ගයකි. මැද රට තෙත් කලාපයේ මෙම පලතුරු වර්ගය ඉතා හොඳින් වැඩේ. පහත රට තෙත් කලාපයේ තද සුළං රහිත ප්‍රදේශවල මෙම පලතුරු වර්ගය වගා කල හැක. සාර්ථක වගා වකට අවශ්‍ය වන්නේ හොඳින් පැතිරී ඇති අඟල් 30–40 (මිලි මීටර් 7500–10000) වර්ෂා පතනයක් වුවත්, සමහර ප්‍රභෙද නිවර්තන තත්ත්වයන් යටතේ අඟල් 100 වැඩි (මිලි මීටර් 25,000) වර්ෂා පතනයක් සහිත ප්‍රදේශ වලද වගා කෙරේ. හොඳින් ජලය බැස යන ලෝම පසක් අලි ගැට පේර වගාවක් සඳහා සුදුසු වේ. පසේ දූර්වල ජලවහන තත්ත්වය ශාක කෙරෙහි අහිත කර ලෙස බලපායි. වියළි කලාපයේ වගා කරන්නේ නම් ජල සම්පාදන පහසුකම් තිබිය යුතුය.

**වගා කරන ප්‍රභෙද**

මෙරට වගා කරන ප්‍රභෙද අතර පහත සඳහන් ප්‍රභෙද ප්‍රධාන ස්ථානයක් ගනී. පොලොක් නැමති ප්‍රභෙදය ඉතා විශාල වශයෙන් වගා කෙරේ. එහි ගෙඩි දිගටි ස්වභාවයක් ගන්නා අතර එය ගෙඩියක බර ග්‍රෑම් 675 සිට 900 අතර ප්‍රමාණයක් විය හැක. මෙම ප්‍රභෙදයේ බීජ විශාල අතර මාංශල කොටස කහ පාටය. ඉදුනු විටද පොත්ත කොළ පාටින් යුක්තය. පර්පල් හයිබ්‍රිඩ් ප්‍රභෙදයේ ගෙඩි ඉදුනු විට දම් පැහැයක් ගනී. ගෙඩි එතරම් විශාල නැත. ගෙඩි ප්‍රමාණයෙන් පොලොක් ප්‍රභෙදයේ ගෙඩි වලට වඩා කුඩා වන අතර එහි ගෙඩිවල මාංශලය මනා රසකින් යුත්තය. ගොඩ්ප්‍රි නම් තවත් ප්‍රභෙදයක් ඇති අතර එහි ගෙඩිවල පොත්ත ඉදුනු විට දම් පැහැයක් ගනී. මෙම ගෙඩි පර්පල් හයිබ්‍රිඩ් ගෙඩි වලට වඩා ප්‍රමාණයෙන් විශාල අතර දිගටි හැඩයක් ගනී. මෙයට අමතරව මෙරට දෙමුහුන් කල වෙනත් අලිගැටපේර ප්‍රභෙද ද දක්නට ලැබේ.

**රෝපන ද්‍රව්‍ය**

බද්ධ පැල හා බීජ පැල අලි පේර වගාවන් සඳහා යොදා ගනු ලැබේ. බීජ වල ප්‍රරෝහන ශක්තිය ඉක්මනින් නැති වන නිසා ගෙඩි වලින් බීජ ඉවත් කළ විගස ඒවා සිටවිය යුතුය. මුල් කුණු වීමේ රෝගය ඇති කරන දිලීර ආක්‍රම ණයන් වැළැක් වීමට තවාන් කිරීමට භාවිතා කරන අලි පේර කෙලින්ම ශාක යෙන් නෙලා ගත් ගෙඩි වලින් ලබා ගත් බීජ විය යුතුය. බිම වැටුනු ගෙඩි වලින් බීජ ලබා ගන්නේ නම් ඒවා සෙන්ටිග්රේඩ් 50 උණුසුම් ජලයේ විනාඩි 30 තබා සිටුවීමට භාවිතා කල යුතුවේ. උස් තවාන් පාත්ති වල සිටුවා පැල කර ගත් බීජ පැල මුල් අවස්ථා වේදීම පොලිතින් බෑග් වලට මාරු කල යුතුවේ. උස් පාත්තිවල බීජ සිටුවන විට බීජයේ කෝණාකාර හැඩය ඇති පැත්ත උඩට සිටින සේ සිටවිය යුතුය. අලි ගැට පේර පර පරාගනය වන ශාඛ යක් හෙයින් බීජ පැල මගින් සමාන ගුණාංග ඇති පැල ලබා ගත නොහැක. බෑග්වල සිටවූ පැල වලට මාස 5 – 8 ක් පමණ වූ විට භූමියේ සිටුවීම සඳහා භාවිතා කළ යුතුවේ. ඒකාකාර වගාවක් ලබා ගැනීමට බද්ධ පැල භාවිත කිරීම සුදුසු ය. අංකුර බද්ධ හෝ රිකිලි බද්ධ ක්‍රම බද්ධ පැල නිපදවා ගැනීමට යොද ගත හැක. බද්ධ පැලවලට මාස 10 ක් ගත වූවාට පසුව ක්ෂේත්‍රයේ සිටුවීමට පුළුවන. බද්ධ පැල වලට අවුරුදු 3 – 4 පමණ ගත වූ පසු හොඳ වගා තත්වයන් යටතේ එල හට ගැනීම ආරම්භ වේ.

## පරතරය

ක්ෂේත්‍රයේ පේළි තුළ හා පේළි අතර පරතරය මීටර් 8 × 8 (අඩි 25 — 25) වන සේ සිටුවන ස්ථාන සලකුණු කර ගත යුතුවේ. ඉන් පසු එම ස්ථානවල සෙ.මී. 60 (අඩි 2) දිග, සෙ.මී. 60 (අඩි 2) පළල හා සෙ.මී. 60 (අඩි 2) ගැඹුර ඇති වලවල් සකස් කර ගත යුතු වේ. මෙම වලවල් මතුපිට පස්, කොම්පෝස්ට් හ වේලුණු ගොම මිශ්‍ර පස් මිශ්‍රණයකින් පිරවීම වඩා සුදුසුය. පැල සිටුවීමට පෙර නිර්දේශිත පොහොර මිශ්‍රණ යෙන් නිර්දේශිත ප්‍රමාණය වලට යෙදිය යුතුය. පැල සිටවූ විගස පස හොඳින් තෙත් කල යුතුවේ. ඉන් පසුව අවශ්‍ය තාව අනුව ජල සම්පාදනය කිරීම වැදගත්වේ.

## පොහොර යෙදීම

අලි ගැට පේර සඳහා එන්.පී.කේ. 12 : 14 : 14 පොහොර මිශ්‍රණය නිර්දේශ කර ඇත. මෙම මිශ්‍රණයෙන්, කිලෝ ග්‍රෑම 50 ක් සාද ගැනීම සඳහා යූරියා කිලෝ ග්‍රෑම 13 ක්ද, රොක් පොස්පේට් කිලෝ ග්‍රෑම 25 ක්ද, මියුරේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම 12 ක්ද, මිශ්‍ර කර ගත යුතුය. පැල සිටුවන අවස්ථා වේදී පොහොර මිශ්‍රණයෙන් කිලෝ ග්‍රෑම 1/2ක් වල පිරවීමට ගන්නා පස් සමඟ හොඳින් මිශ්‍ර කර ගත යුතුයි. පළමු වෙනි වසරේදී කිලෝ ග්‍රෑම 1/2 ක්ද, දෙවෙනි වසරේදී කිලෝ ග්‍රෑම 1 ක්ද, තුන්වෙනි වසරේදී කිලෝ ග්‍රෑම 1 1/2 ක්ද, හතර වෙනි වසරේදී කිලෝ ග්‍රෑම 02 ක්ද, පස්වෙනි වසරේදී කිලෝ ග්‍රෑම 2 1/2 ක්ද, හා හයවන වසරේදී කිලෝ ග්‍රෑම 03 බැගින් ද ගසකට යෙදිය යුතුවේ. වසරකට යෙදිය යුතු පොහොර ප්‍රමාණය කොටස් දෙකකට බෙදා දෙවතාවකදී යෙදීම වඩා සුදුසුය.

එල හටගත් පසු වසරක් පාසා නිර්දේශිත පොහොර මිශ්‍රණයෙන් කිලෝ ග්‍රෑම 03 ක් යෙදීම කල යුතුයි. හැකි සෑම අවස්ථාවකදීම ගස වටා වේලුණු ගොම හෝ කොම්පෝස්ට් පොහොර පසට යෙදීම කළ යුතුයි. මෙයට අමතරව ඩොලමයිට් කිලෝ ග්‍රෑම 2 1/2 සෑම අවුරුද්දකදීම ගසකට යෙදීම යෝග්‍යය. ඩොලමයිට් යෙදීම, පොහොර යෙදීමට සති 02 පෙර සිදු කල යුතුවේ.

## නඩත්තු කිරීම

සමහර අවස්ථාවලදී බීජ පැල අතු බෙදීමක් නැතිව වර්ධනය වේ. එවැනි අවස්ථා වලදී අතු බෙදීම ඇති වීම සඳහා අග්‍රස්ථ අංකුරය කපා දමනු ලැබේ. බද්ධ පැල සිටුවා ඇති විට ග්‍රාහක කඳෙන් අතු රිකිලි ඇතිවීම වළකා ගැනීමට කටයුතු කල යුතුයි.

## පරාගනය

අලි ගැට පේර වල මල් ද්විලිංගික වන අතර ඒවා පර පරාගනය වීම සඳහා සකස් වී ඇත. පරාගනය වැඩි වශයෙන් කෙරෙන්නේ මී මැස්සන් ගෙන් හා බඹරුන් ගෙන්ය. සමහර ගස්වල පුෂ්ප වල කලංක පරාග ග්‍රාහීවීම (ලබා ගැනීම) යම් කාලයකට පමණක් සීමා වීම කලංකය පරාග වලට ග්‍රාහී (ලබා ගන්නා) අවස්ථාවලදී පරාග නොමැති වීම නිසා එම ගස්වල එල දුරීමක් සිදු නොවේ. එම නිසා අලි ගැට පේර ගස් වැවීමේදී ගස් කිපයක් ගෙවත්තේ වගා කර ගැනීම වැදගත් වේ. ඉතාමත් කලාතුරකින් සම සංසේචනය සිදුවන මාදිලි දක්නට ලැබෙන අතර එවැනි මැදිලි බද්ධ ක්‍රම මගින් ප්‍රචාරණය කිරීම වැදගත් වේ.

## එල හට ගැනීම

බීජ වලින් ලබා ගන්නා බීජ පැල වල ගෙඩි හට ගැනීම අවුරුදු 4 – 5 පමණ සිදුවේ. බද්ධ පැල වලින් ගෙඩි හට ගැනීම අවුරුදු 3 – 4 පමණ කාලයකින් සිදුවේ. කොළ පැහැති ප්‍රභෙද දම් පැහැති ප්‍රභෙද වලට වඩා ඒකාකාර එලදාවක් පෙන්නුම් කරන බව වාර්තාවේ.

## එල නෙලීම

පොලොක් සහ ගොඩ්ප්‍රි යන ප්‍රභෙද විශාල ගෙඩි නිෂ්පාදනය කරන අතර ගසකින් ගෙඩි 100ට වැඩි ප්‍රමාණයක අස්වැන්නක් එක වරකදී ලබා ගත හැක. දේශීය ප්‍රභෙද වලින් නිපදවන ගෙඩි කුඩා වන අතර ඒවායේ බර ග්‍රෑම් 300 – 400 අතර වේ. එහෙත් මෙම ගස්වල හටගන්නා ගෙඩි ප්‍රමාණය වැඩිය. සරු වට වැඩෙන ගස් අඩි 50 – 60 පමණ උසට වර්ධනය වන අතර එක් වාරයකදී ගෙඩි 500 පමණ අස්වැන්නක් බලාපොරොත්තු විය හැක. අස්වනු නෙලීමේදී ගෙඩි බිමට වැටුණු විට පුපුරා යෑම හා තැලීම සිදුවන නිසා එය වළකා ගත යුතු වේ. අලි ගැට පේර ගස් වල පළමු ගෙඩි හට ගැනීමේ සිට වසර 10 ක් පමණ යන තුරු අස්වැන්න ක්‍රම යෙන් වැඩි වන බව නිරීක්ෂණය කර ඇත.

## රෝග මර්ධනය

01. පාමුල කුණු වීමේ රෝගය හෙවත් මුල් කුණුවීමේ රෝගය

පිටොප්තොරා විශේෂයේ දිලීරයක් නිසා මෙම රෝගය ඇති වේ. රෝග ලක්ෂණ වන්නේ පැල මැලවීම, පත්‍ර කහ පාට වී හැලීම, මුල් කුණු වී ගස් ඇද වැටීමය. මෙම රෝගය වලකා ගැනීමට හොඳින් තෝරා ගත් ග්‍රාහක කඳන් බද්ධ කිරීමට යොදා ගත යුතුවේ. තවාන් කිරීම සඳහා රෝග කාරක දිලීර යන්ගෙන් තොර බීජ ලබා ගැනීමෙන් ද මෙට රෝගය වලකා ගත හැක.

**අලි ගැට පේර වල මල් ද්විලිංගික වන අතර ඒවා පර පරාගනය වීම සඳහා සකස් වී ඇත. පරාගනය වැඩි වශයෙන් කෙරෙන්නේ මී මැස්සන්ගෙන් හා බඹරුන් ගෙන්ය. සමහර ගස්වල පුෂ්පවල කලංක පරාග ග්‍රාහී වීම (ලබා ගැනීම) යම් කාලයකට පමණක් සීමා වීම කලංකය පරාග ග්‍රාහී (ලබා ගන්නා) අවස්ථාවල දී පරාග නොමැති වීම නිසා එම ගස්වල එල දුරීමක් සිදු නොවේ. එම නිසා අලිගැට පේර ගස් වැවීමේදී ගස් කීපයක් ගෙවත්තේ වගා කර ගැනීම වැදගත් වේ. ඉතාමත් කලාතුරකින් සම සංසේචනය සිදුවන මාදිලි දක්නට ලැබෙන අතර එවැනි මාදිලි බද්ධ ක්‍රම මගින් ප්‍රචාරණය කිරීම වැදගත් වේ.**